# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

# 3 වසර - Grade 3

# සිංහල

**කාලය පැය: 03**

- **I කොටසේ සහ II කොටසේ ප්‍රශ්න සියල්ලටම ද III කොටසේ ප්‍රශ්න දෙකකටද පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මිශ්‍ර සිංහල හෝඩියට අයත් අක්ෂර සංඛ්‍යාව කීය ද?

ii. සිංහල අක්ෂර මාලාවේ **සඤ්ඤක** අක්ෂර ලියා දක්වන්න.

iii. '' ශ,ෂ,ස,හ,ළ '' යන අක්ෂර හඳුන්වන නම කුමක් ද?

iv. නාසික්‍ය අක්ෂරවලට ගැනෙන අක්ෂර මොනවා ද?

v. ''නිල්+උපුල් - දකුණු + අත'' යන විසන්ධි පද සන්ධි කරන්න.

vi. ''කළුගල ,හෙරණසික,''යන සමාස පදවල සමාස වර්ගය නම් කරන්න.

vii. ''උත්තම,අභ්‍යන්තර'' යන වචනවල විරුද්ධාර්ථ පදය ලියන්න.

viii. ''ළමයා පොත කියයි.'' ''ගුරුවරයා පොත බලයි ''මෙම වාක්‍ය බහුවචනයට හරවන්න.

ix. '' ගුණවත්, වකුටු ''මෙම පදවල තද්ධිත ප්‍රත්‍ය වෙන් කොට දක්වන්න.

x. ''අශ්වයා, මොනරා'' යන නාම පදයේ ස්ත්‍රීවාචී නාමය දක්වන්න ( ලකුණු 20)

## II කොටස

2. (අ) පහත සඳහන් මාතෘකා අතරින් **එකක්** තෝරා ගෙන වචන 200 කට නොඅඩු **රචනයක්** ලියන්න.

i. පරිසරය රැක ගනිමු

ii. ජංගම දුරකථනය හා ළමා පරපුර,

iii. මත්ද්‍රව්‍ය උවදුර පිටු දකිමු,

iv. ඔබ ගිය අධ්‍යාපන චාරිකාව,

v. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ( ලකුණු 20)

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු **ක්‍රියා පදය** වරහන් තුළින් තෝරා ලියන්න.

i. මහා නාහිමියෝ බුරුමයට වැඩම ........................... ( කරයි, කරති )

ii. ගස් සුළඟට .................................................... ( වැටුණෝය, වැටුණේය)

iii. ජනාධිපතිතුමා නිදහස් දින ජාතිය ...................... ( අමතයි , අමතති)

iv. පියා හෝ මම හෝ මහනුවර .................................. ( යමු , යමි )

v. ඇත්තු පෙරහැරේ ගමන් .................................... ( කරයි , කරති )

(ලකුණු 05)

3. (අ) පහත සඳහන් ඡේදය තුනෙන් එකක් වන සේ **සාරාංශ** කරන්න.

සාහිත්‍ය කරුවා තමාගේ අත්දැකීම් පාඨකයාට ඉදිරිපත් කරන්නේ භාෂාව මගිනි භාෂාව වූ කලී අදහස් , හැඟීම් ගෙන යන වාහනයයි. ලේඛකයා තම හදවත කම්පනය කළ අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරන්නේ වචන අනුසාරයෙනි, කවියෙකු හා විචාරකයෙකු වන '' එස්රා පවුන්ඩ් '' ප්‍රකාශ කරන අන්දමට හැකිතාක් දුරට අර්ථාරෝපණය කරන ලද භාෂාව සාහිත්‍යය වශයෙන් හැඳින්විය හැකිය.

( ලකුණු 10)

(ආ) ඔබ පිරිවෙණෙහි පුස්තකාලය සඳහා වඩාත් කියවීමට ප්‍රිය ජනක පොත් ප්‍රමාණයක් ලබා දෙන ලෙස ඉල්ලමින් ඔබ, පිරිවෙණේ ශිෂ්‍ය සංගමයේ ලේකම් යැයි සිතමින් ගරු කෘත්‍යාධිකාරි හිමියන් වෙත යැවෙන ''රාජකාරි'' ලිපියක් සකස් කරන්න.(නිර්නාමික නම් භාවිත කරන්න)

( ලකුණු 15)

## III **කොටස**

04. බුදුගුණු අලංකාර ග්‍රන්ථයෙහි සඳහන් කවිය ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''සග සිරි අසා ලා
කළයුරු සොඳුරු සා ලා
සිරින් සුවි සා ලා
පවර නුවරෙක් වී විසා ලා''

i. බුදුගුණ අලංකාර ග්‍රන්ථයෙහි කතුවරයා කවරෙක් ද? (ලකුණු 02 )

ii. බුදුගුණ ලංකාරය කවර සාහිත්‍ය යුගයක රචනා වීද? ( ලකුණු 02)

iii. මෙම කවියෙහි අදහස සරල බසින් ලියන්න. ( ලකුණු 05 )

iv. '' **සගසිරි, සොඳුරු,පවර** '' යන්නෙහි තේරුම් දක්වන්න. ( ලකුණු 03 )

v. මෙම කවියෙන් කියවෙන නගරය කුමක්ද? ( ලකුණු 03 )

05. (අ) උම්මග්ග ජාතකයේ පැන විසඳුම් කොටසේ එන ඔබ සිත් ගත් ප්‍රශ්නයක් කෙටියෙන් ලියන්න ( ලකුණු 15 )

06. මිනිස් ජීවිත යහපත් මාවතකට යොමු කිරීමට උපදෙස් දෙන ග්‍රන්ථයකි. වනකථා - ( මිතුරන්ගේ අගය) මෙම කියමන **කථාවක්** ඇසුරෙන් විමසන්න.

( ලකුණු 15 )